# සිංහල භාෂාව හා සාහිත්‍යය

## 11 ශ්‍රේණිය



The National e-learning Portal for The General Education

Start Your Learning Journey with e-thaksalawa

## ඒකකය : පද බෙදීම

<u>පද බෙදා ලිවීමේ දී අනුගමනය කළ යුතු රීති</u>

➢ <u>පද වෙන් කර ලියන අවස්ථා</u>

- **නාම, ක්‍රියා, නිපාත** යන පද වර්ග වෙන් වෙන් ව ලිවිය යුතු ය.

  උදා: අම්මා ද මම ද නුවර ගියෙමි.

  (අම්මා, මම → නාමපද; ද, ද → නිපාත; ගියෙමි → ක්‍රියා)

- වාක්‍යයක් නාම පදයකින් අවසන් කර ඇති විට ඒ සමඟ යොදන **'යි'** නිපාතය වෙන් කරයි.

  උදා: ළමයා දුටුවේ ඈත මුහුද **යි**.

- නාම පදයක අගට යෙදෙන දී නිපාතය වෙන්කරයි.

  උදා: පාසලේ දී, සභාවේ දී

- 'ම' නිපාතය ඈත්කර ලියයි.

  උදා: ඔබ ම එන්න.

- විභක්ති අර්ථ දීම සඳහා යොදන **උපකාරක නිපාත** වෙන් කරයි.

  උදා: රජුන් විසින්, මිනිසුන් කෙරෙන්, දුප්පතා කෙරෙහි, ධර්මය කරණකොට

- ක්‍රියාපද සමග 'නො' නිපාතය ඈත් කෙරේ.

  උදා: නො දුටිමි නො අසති

- **විශේෂණ විශේෂ්‍ය** වෙන්කර ලියනු ලැබේ.

  උදා: ඉසුරු යෝගය, උස් කුළුණ

- 'කර' ධාතුවෙන් සෑදෙන පද වෙන් කරයි.

  උදා: වචන ඈත් කර ලියන්න.

- 'ල' නිපාතය වෙන් කරයි.

  උදා: පසෙක ලා

අන්තර්ගතය : තමින්ද කුමාර හෙට්ටිආරච්චි - විද්‍යාරාජ මහා විද්‍යාලය, හෝකන්දර
සැකසුම : කසුන් ලහිරු ප්‍රියදර්ශන - අම්/දෙහිඅත්තකණ්ඩිය ජාතික පාසල

- <u>පද එක්කොට ලියන අවස්ථා</u>

  - පදවල මුලට යෙදෙන **උපසර්ග** එක් කොට ලියයි.

    උදා: <u>සු</u>දන, <u>පිළි</u>ගැනීම, <u>උප</u>ගුරු

  - සම්බන්ධාර්ථවාචී **'යි'**, **'ත්'** එක්ව ලියයි.

    උදා: නුඹත්, මමත්, ගසුයි, මලුයි

  - **වරයා, වරු, කරු, කාරි** පද එක්කර ලියයි.

    උදා: ගුරුවරයා, රජවරු, මුරකරු, සහකාරී

  - බහු වචන හැඟවීමට යොදන **'වල්'** ප්‍රත්‍ය එක්කොට ලියයි.

    උදා: ගෙවල්, පොත්වලින්, මල්වලට

  - **තුමා, තුමී** පෙර පදය හා එක් කරයි.

    උදා: ගුරුතුමා, අගමැතිතුමිය

  - ඉලක්කමකින් අගට යෙදෙන අකුරු එක් කරයි.

    උදා: 13ක්, 120ට, 9ක

අභ්‍යාස 01

01. පහත දැක්වෙන වාක්‍යාංශවල පද බෙදීමේ වැරදි අවස්ථා යටින් ඉරක් ඇඳ පසුව නිවැරදි කොට ලියන්න.

උදා: දේවාලය දිරාගොස් තිබූ නිසා හිසමත වැටිණි.

i. දිරා ගොස් ii. හිස මත

i. නැති දෙයක් කෙසේ හෝ ලබා ගැනීම ඉබ්බාගෙන් පිහාටු ගැනීමකි.

..........................................................................................................

ii. 'නටමි' යනු වර්තමාන කාල උත්තම පුරුෂ ඒකවචන ආඛ්‍යාත පදයකි.

..........................................................................................................

iii. අසරණ දරුවා සිඟාගත් බත් කමින් සිටියේය.

..........................................................................................................

iv. දරුවන් පිණිස සමත් කරන්නැයි නගරාධිපති තුමා ඉල්ලා සිටියහ.

..........................................................................................................

v. එදිරිවීර සරච්චන්ද්‍ර දක්ෂ නාට්‍යකරුවෙකු මෙන්ම ප්‍රකට නවකතා රචකයෙක්ද විය.

..........................................................................................................

vi. තිළිණ හා සහතික පත් ජයග්‍රාහකයන් වෙත පිරිනැමීම මෙ දින සිදුවිය.

..........................................................................................................

vii. තව ද ශිෂ්‍යයන් යම් කරුණක් පොත පත කියවීමෙන් දැන ගත් බව කිව හැකි නොවේ.

..........................................................................................................

viii. උම්මග්ග ජාතකය රචනා කිරීමේ අරමුණවී ඇත්තේ කුමක්ද?

..........................................................................................................

ix. උක්ත නාමපද පමණක් යෙදී ඇති වරණය තෝරා ලියන්න'යි එම ප්‍රශ්න පත්‍රයේ දක්වා තිබිණි.

..........................................................................................................

x. ස්වාභාවික විපත් සහ ආපදා තත්තවගැන ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශ වලින් නිතර අසන්ට ලැබේ.

..........................................................................................................

අන්තර්ගතය : තමින්ද කුමාර හෙට්ටිආරච්චි - විද්‍යාරාජ මහා විද්‍යාලය, හෝකන්දර
සැකසුම : කසුන් ලහිරු ප්‍රියදර්ශන - අම්/දෙහිඅත්තකණ්ඩිය ජාතික පාසල

02. පහත දැක්වෙන කොටස්වල පද බෙදීමට අදාළ තැනින් ඇල ඉරක් ( / ) අඳින්න. පසුව නිවැරදිව තිත් ඉරි මත ලියන්න.

උදා:
මේ/ග්‍රන්ථය/නිර්මාණය/වී/ඇත්තේ/දෙවසරක/පමණ/කාලයක්/තිස්සේ/කතුවරයා/විසින්/කරන/ලද/පර්යේෂණාත්මක/ගවේෂණවලින්/අනතුරුව/ය.

මේ ග්‍රන්ථය නිර්මාණය වී ඇත්තේ දෙවසරක පමණ කාලයක් තිස්සේ කතුවරයා විසින් කරන ලද පර්යේෂණාත්මක ගවේෂණවලින් අනතුරුව ය.

i. අපේකවීන්ගේමේමුරණ්ඩුකම්වලටඑරෙහිවඅල්පමාත්‍රවශයෙන්හෝහඬක්නැගුණුබවටසාත්ෂ්‍යසාහිත්‍යයඉතිහාසයෙහිර්ටඑක්හේතුවක්වන්ටඇත්තේඑඑසඳැස්ලකුණුකරුවාසිංහලයේවිරිත්සම්බන්ධයෙන්පළකළාවූඇතැම්අදහස්යැයිසිතියහැකිය.

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

ii. විද්‍යාවඇත්තසොයනඅසහායක්‍රමයක්ලෙසසලකනලද්දේතර්කයෙන්හැමදෙයක්පිළිබඳඇත්තදතහැකියැයිසිතාගර්විතවූබටහිරලෝකයාතිකයන්විසිනි.

..........................................................................................

..........................................................................................

..........................................................................................

iii. උදාසීනදුක්මුසුකලකිරුණුඅඳුරුපැවැත්මබුද්ධධර්මයටපටහැණියඑයසත්‍යාවබෝධයටබාධාවකිප්‍රීතියවනාහිනිවන්දැකීමසඳහාවැඩියයුතුඅංගසතෙන්එකක්බවමෙහිලාසඳහන්කළයුතුය.

..........................................................................................

..........................................................................................

..........................................................................................

iv. උපමාඋපමේයන්කෙරෙහිපිහිටියම්කිසිගුණයකසමානාර්ථයනිසාඒදෙකනොවෙනස්කොටදැක්වීමරූපකනම්වෙයිරූපකයඋපමාවෙහිමප්‍රභේදයකිඑහිමෙන්සේවැනිආදීනිපාතනොයෙදෙයි.

..........................................................................................

..........................................................................................

..........................................................................................

v. 1818දීවෙල්ලස්සෙකැරැල්ලේදීදිවිපිදූසුරුවිරුහෙළයන්ගේලේවලඋණුසුමමැකෙන්නටත්කලින්1848දීනොවහල්රැසක්ලෙසනැගීසිටින්නටඔහුගත්දෙවනතැතදපුහුබවටපත්වූයෙන්පුරන්අප්පුගොංගාලේගොඩබණ්ඩාඅදවිරුවෝපෝරකයටබිලිවුහ.

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

අන්තර්ගතය : තමින්ද කුමාර හෙට්ටිආරච්චි - විද්‍යාරාජ මහා විද්‍යාලය, හෝකන්දර
සැකසුම : කසුන් ලහිරු ප්‍රියදර්ශන - අම්/දෙහිඅත්තකණ්ඩිය ජාතික පාසල